සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

නම : ............................................... පෙරදිග සංගීතය කාලය : පැය 02 යි.

## I කොටස

v ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. නි̤.ධ̤...නි̤රිග...ප රි ස යනුවෙන් ස්වර යෙදෙන රාගය,
   i. බිලාවල් ii. හිම්පලාසි iii. යමන් iv. කාෆි

2. තබ්ලාවේ බායාං කොටසින් පමණක් උපදින අක්ෂරයකි,
   i. ධිං ii. ගෙ iii. ධා iv. ති

3. |ස - ස |ස රි ග රි | රි ග ම | ග ප ම ග |
   ඉහත ප්‍රස්ථාර කොටස සඳහා වාදනය කිරීමට සුදුසු තාලය වන්නේ,
   i. ජප් තාලයයි ii. දිප්චන්දි තාලයයි iii. ඡෙම්ටො තාලයයි iv. ත්‍රිතාලයයි

4. ප්‍රධාන තත් 7ක් හා අනුතත් ගණනාවකින් සමන්විත පෙරදිග සංගීත භාන්ඩයකි,
   i. සිතාරය ii. එස්රාජය iii. ගිටාරය iv. වයලීනය

5. 'ස ග රි ස' යන ස්වර ඛණ්ඩය උච්ච (ස̇) දක්වා යමන් රාගයට අනුව ගොඩනැංවීමේදී ඊලගට යෙදිය යුතු ස්වර කණ්ඩ දෙක වන්නේ
   i. සරිගස, රිම̍ගරි ii. ගපම̍ග, පම̍ගරි iii. රිම̍ගරි, ගපම̍ග iv. සගරිස, ගපම̍ග

6. උතුරු ඉන්දීය සංගීත සම්ප්‍රදායේ ප්‍රධාන තාලවාද්‍ය භාණ්ඩය වන්නේ,
   i. තබ්ලාව ii. ගැටබෙරය iii. දවුල iv. තම්මැට්ටම

7. රාගයකට අයත් නැති නමුත් රාගය අලංකාර කිරීම සඳහා ඉදහිට සුලුවෙන් යොදාගන්නා ස්වර
   i. විවාදි ස්වර වේ ii. සංවාදි ස්වර වේ iii. වාදි ස්වර වේ iv. අනුවාදි ස්වර වේ

8. ග,නි කෝමලව යෙදෙන හා ඖඩව සම්පූර්ණ ජාතියට අයිති රාගයකි,
   i. හිම්පලාසි රාගය ii. කාෆි රාගය iii. යමන් රාගය iv. භෛරවි රාගය

9. භාරතීය ගායන ශෛලීන් අතරින් දෙවියන්ගේ ගුණ වර්ණනා කරන ගීත විශේෂයක් වන්නේ ,
   i. භජන් ගීත ii. මධ්‍යලය ගීත iii. තරාණා ගීත iv. කව්වාලි ගීත

10. භූපාලි රාගයට අදාල නිවැරදි ප්‍රකාශය වන්නේ,
    i. ඖඩව ජාති ග,ධ වාදි සංවාදි වේ. ii. සම්පූර්ණ ජාති ධ,ග වාදි සංවාදි වේ.
    iii. ඖඩව ජාති ග,නි වාදි සංවාදි වේ. iv. සම්පූර්ණ ජාති ග,නි වාදි සංවාදි වේ.

V අංක 11 සිට 20 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති වචන ඇසුරෙන් පිළිබඳ සපයන්න.

(දොහොරාව, මුස්ලිම් ජාතික, ස්ථායි, අන්තරා, කව්වාලි, භජන්, ගීත ගෝවින්දය, අමීර් කුෂ්රු, අඩුලය, මොහිදීන් බෙග්, සුවදේ ... මට)

උත්තර භාරතීය සංගීතයේ එන ආගමික නැඹුරුවක් සහිත හා ආගමික විශ්වාසයකින් ගැයෙන ගීතවර්ග දෙකක් ලෙස (11) ........................................ හා (12) .................................. යන ගීත හැඳින්විය හැක.දෙවියන්ගේ ගුණ වර්ණනා කිරීම සඳහා යොදාගත් ගීත භජන් ගී වේ. එසේම ජයදේවයන් විසින් රචිත (13)......................................... නම් ග්‍රන්ථයේ ඇතුලත් කාව්‍යයද භජන් ගී ලෙස ගයා ඇත.

කව්වාලි ශෛලියද ආගමික නැඹුරුවක් තුළ ගැයුවකි. මෙම ශෛලියේ නිර්මාතෘවරයා වන්නේ (14) ...................................... ජාතික (15)...................................... නැමැත්තෙකි. කව්වාලි ගී වල මුල් කොටසේ හා මැද අතරතුර තාලයෙන් තොරව ගැයෙන ගීත කොටසකි. එය (16)............................................... නම් වේ. මෙම කව්වාලි ගීත (17)........................................... ආකෘතියට අනුව නිර්මාණය වී ඇති අතර මෙම ගීත ශෛලිය අනුව ලංකාව තුළද බොහෝ ගී නිර්මාණය වී ඇත. ඒ සඳහා දායකවීමේ ගෞරවය හිමිවන්නේ (18) .............................. නැමැති ගායකයාටය (19)............................................ යන ගීතය එයට උදාහරණයකි. මෙම කව්වාලි ගීත (20) ........................ කින් ආරම්භ වී අවසානයේ ලය වැඩි කරමින් ගායනා කෙරේ.

## II කොටස

V ප්‍රශ්න 3කට පමණක් පිළිතුරු සපයන්න.

1. සිතාරය, තබ්ලාව, තාම්පුරාව, එස්රාජය, කොම්බුව, ගැටබෙරය, රබාන, ජලතරංග, සර්පිනාව, හොරණෑව, බුම්මැඩිය, තම්මැට්ටම, දවුල, උඩැක්කිය, තාලම්පට, පන්තේරුව
   - (අ) ඉහත දක්වා ඇති භාණ්ඩ හින්දුස්ථානි සහ දේශීය වශයෙන් බෙදා දක්වන්න.
   - (ආ) තත්, අවනද්ධ,ඝන, සුසිර යන හින්දුස්ථානි භාණ්ඩ වර්ගීකරණය අනුව භාණ්ඩ 4ක් උදාහරණ ලෙස ලියා දක්වන්න. (ලකුණු 8)

2. (අ) කෙත හා බැඳි ගැමි ගී වර්ග 3ක් නම් කරන්න. (ලකුණු 3)
   - (ආ) ඉන් එක් ගීතයක පද මාලාව ලියා දක්වන්න. (ලකුණු 4)
   - (ඇ) ජන ගී ආශ්‍රිත සරල ගී 3ක් නම් කරන්න. (ලකුණු 3) (ලකුණු 10)

3. (අ) දේශාභිමානි ගීතයක් යනු කුමක්ද?
   - (ආ) දේශාභිමානි ගීතයකට යොදා ගැනිමට වඩාත් සුදුසු භාණ්ඩ 3ක් නම් කරන්න.
   - (ඇ) ඔබ දන්නා දේශාභිමානි ගීතයක මුල්කොටස ලියා දක්වන්න.

4. (අ) දේශිය අවනද්ධ භාණ්ඩ 4ක් නම්කරන්න.
   - (ආ) ඉන් එක් භාණ්ඩයක දල රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

5. (අ) පහත දැක්වෙන ගී පාදය මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| ස ම ම ම | ම - - - | ම ධ ප ම | ග ම ග රි |
| රි ග ස රි | ග - මගරි | රි ග ස රි | ස - - - |

   - (ආ) බිලාවල් රාගයේ ආරෝහණය මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් වැයීමේදි ලැබෙන විකෘති ස්වර නම් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

### පෙරදිග සංගීතය පිළිතුරු පත්‍රය

### I කොටස

1. 3
2. 2
3. 2
4. 1
5. 3
6. 1
7. 1
8. 1
9. 1
10. 1
11. කව්වාලි
12. භජන්
13. ගීත ගෝවින්දය
14. මුස්ලිම් ජාතික
15. අමීර් කුෂ්රු
16. දොහොරාව
17. ස්ථායි අන්තරා
18. මොහිදීන් බෙග්
19. සුවදේ මට සීතල
20. අඩුලයකින්

(ලකුණු 20)

### II කොටස

1. (අ) හින්දුස්ථානි : සිතාරය, තබ්ලාව, තාම්පුරාව, එස්රාජය, ජලතරංග, සර්පිනාව, බටනලාව

   දේශිය : කොම්බුව, ගැටබෙරය, රබාන, හොරණෑව, බුම්මැඩිය, තම්මැට්ටම, දවුල, උඩැක්කිය, තාලම්පට, පන්තේරුව (බටනලාව)

   (ආ) හින්දුස්ථානි වර්ගීකරණය : තත්, සුසිර, ඝණ, අවනද්ධ

   දේශීය : ආතත, විතත, විතතාතත, ඝණ, සුසිර

2. (අ) ගොයම්, නෙළුම්, කමත්

   (ආ) .................................

   (ඇ) 1. රුක් අත්තන මල - උකුසා වන්නම

   2. ලක්වැසියන් - සේ ගී

   3. මල්සරා බැල්ම - තිසරාවන්නම

   (ලකුණු 10)

3. (අ) උපන් දේශය පිළිබඳ අභිමානයෙන් යුතුව ගැයෙන ගීත.

   (ආ) සර්පිනා, තම්මැට්ටම්, තබ්ලා, බටනලා

(ඇ) කැමති දේශාභිමානි ගීතයක් (ලකුණු 10)

4. (අ) ගැටබෙරය,

දවුල

තම්මැට්ටම

උඩැක්කිය

(ආ)

(ලකුණු 10)

5. (අ) මධ්‍යම භාවයෙන්ඃ

පංචම භාවයෙන් ඃ

( ලකුණු 10 )

(ආ) ...........................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 9 - 2017

**නම : ............................................... පෙරදිග සංගීතය ප්‍රායෝගික පරීක්ෂණ කාලය : පැය 02 යි.**

1. කැමති රාගයක මධ්‍යලය හෝ සරල ගීතයක්
   - ගායනය වාදනය ( ලකුණු 10 )

2. විෂය නිර්දේශානුකුල හින්දුස්ථානි තාලයක් අතින් නිරූපනය
   ( ලකුණු 10 )

3. කැමති සරළ ගීතයක් - ගායනය / වාදනය
   ( ලකුණු 10 )

4. ගුරුවරයා ගයන ගීතයකට රිද්මයක් තැබීම
   ( කැමති අවනද්ධ වාද්‍ය භාන්ඩයකින් ) ( ලකුණු 10 )

5. නුර්ති, නව නාට්‍ය, ජන ගී ආදි ගීතවලින් කැමති ගීතයක් ගායනය හෝ වාදනය
   ( ලකුණු 10 )